# අන්තෝ ජටා....



කාශ්‍යප මල්ලවාරච්චි

ජාතික වශයෙන් රටට බලපාන තීරණාත්මක දේශපාලන සිදුවීම් කිහිපයක් පසුගිය සති කිහිපය තුළදී රට අභ්‍යන්තරයේ මෙන්ම රටෙන් බැහැරව ද සිදුවුණි. ඉතිහාසයේ ප්‍රථම වරට ජාතික වැදගත්කමකින් යුතු කාරණා සම්බන්ධයෙන් එක්ව වැඩ කිරීම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් අතර පසුගිය 23 දා අරලියගහ මන්දිරයේදී පක්ෂ දෙකේ නායකයින් විසින් අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම එම සිදුවීම් අතර ප්‍රමුඛස්ථානයක් හිමිවන සිද්ධිය වේ. ඒ අනුව ජාතික ප්‍රශ්නය විසඳීම, ආර්ථික සංවර්ධනය, යහපත් රාජ්‍ය පාලනය සහ ස්වාධීන කොමිෂන් සභා සක්‍රිය කිරීම ඇතුළු රාජ්‍ය සේවය දේශපාලනීකරණය කිරීමෙන් මුදවා ගැනීම යන කාරණා හතර සම්බන්ධයෙන් රජය සහ එක්සත් ජාතික පක්ෂය මින් ඉදිරියට වැඩ කිරීමට නියමිතව ඇති අතර ඒ සඳහා වූ අවබෝධතා ගිවිසුමට ශ්‍රීලනිප මහ ලේකම් මෛත්‍රීපාල සිරිසේන මහතාත් එජාප සභාපති මලික් සමරවික්‍රම මහතාත් අත්සන් තබා ඇත.

රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර පසුගිය 28, 29 දින දෙක තුළ ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පැවැති දෙවන සාකච්ඡා වටය රටට ජාතික වශයෙන් තීරණාත්මක බලපෑමක් කරන තවත් ප්‍රධාන සිදුවීමක් වේ.

දෙපාර්ශවය අතර පැවැති එම සාකච්ඡා, එකඟතාවයකින් තොරව අවසන් වූ අතර තවත් සාකච්ඡා වටයක් සඳහා දින නියම කර ගනිමින් එම සාකච්ඡා වටය අවසන් කිරීමට රජය සහ පහසුකම් සපයන තෙවන පාර්ශවය වන නෝර්වේ නියෝජිතයින් දැරූ උත්සාහය එල්.ටී.ටී.ඊ. සංවිධානයේ දැඩි කොන්දේසි හා ස්ථාවරයන් හමුවේ අසාර්ථක විය.

නැවත සාකච්ඡා වටයක් සඳහා දින නියම කර ගැනීමට නම් ඊට පෙර ඒ 9 මාර්ගයේ මුහමාලේ මුරපොළ විවෘත කරන දිනය සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණිය යුතු බවටත් එම දිනට පසු දිනක මීළඟ සාකච්ඡා වටය යොදාගත හැකි බවටත් එල්.ටී.ටී.ඊ. දේශපාලන අංශයේ නායක තමිල් සෙල්වම් දැඩිව ප්‍රකාශ කර සිටීම නැවත සාකච්ඡා වටයක් සඳහා දින නියම කර ගැනීමකින් තොරව එක සාකච්ඡා වටය අවසන් වීමට හේතුවිය.

ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර ඇති රජයේ සාම සාකච්ඡා කණ්ඩායමේ නායක, ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා පවසා ඇත්තේ යාපනය ඇතුළු ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ආකාරයේ එල්.ටී.ටී.ඊ. ප්‍රහාර හා ක්‍රියාකාරකම් නතර කරන්නේ නම්, ඒ පිළිබඳව සලකා බැලිය හැකි බවය. තවද ඒ සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය සහතිකයක් ලබා දුන්නද එයින් සෑහීමකට පත්විය නොහැකි බවත්, එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ඉදිරි ක්‍රියාකාරකම් දෙස බලා ඒ පිළිබඳව තීරණයක් ගැනීමට සිදුවන බවය. ඒ 9 මාර්ගයේ මුහමලේ දොරටුව තවදුරටත් විවෘත නොකිරීමට රජය ගෙන ඇති තීරණය ජාතික ආරක්ෂාව මත තාවකාලිකව ගත් තීරණයක් බවත්, එය සදාකාලිකව වසා දැමීමට රජයට අදහසක් නොමැති බවත් එහිදී කරුණු පැහැදිලි කරමින් නිමල් සිරිපාල ද සිල්වා මහතා පවසා තිබේ. ආරක්ෂක හේතූන් මත මුහමලේ මුරපොල වසා දැමීමට සිදුව ඇත්තේ එල්.ටී.ටී.ඊ. සංවිධානය එම ප්‍රදේශ වෙත විටින් විට ප්‍රහාර එල්ල කරමින් සිටින නිසා බවද පවසා ඇත. කෙසේ වුවද තමිල් සෙල්වම් තවදුරටත් ප්‍රකාශ කරනුයේ මුහමාලේ මුරපොල විවෘත කිරීමෙන් තොරව නැවත සාකච්ඡා වටයක් පිළිබඳව සිතීමේ හැකියාවක් නොමැති බවය.

රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර ජිනීවා නුවර පැවැති දෙවන සාකච්ඡා වටය මෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය අතර ඇති කරගෙන ඇති එකඟතාවය යන සිදුවීම් දෙක එකකට එකක් දෙවන නොවන ආකාරයේ සමාන ජාතික වැදගත්කමකින් යුතු සිද්ධීන් වේ. ඊට සමාන්තරව එම කාරණාවන්ට බද්ධව තවත් නොයෙක් අවශේෂ දේශපාලන සිද්ධීන් හට ගනිමින් තිබුණාද එම සිදුවීම් ජාතික දේශපාලනය



නන්දන ගුණතිලක

කෙරෙහි එපමණ බලපෑමක් කරන බවක් පෙනෙන්නට නොමැත. නිදර්ශණයක් ලෙස ගතහොත් විටෙක ජනතා විමුක්ති පෙරමුණේ ජනාධිපති අපේක්ෂකයා ලෙස කටයුතු කළ එම පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මෙන්ම මේ වනවිටත් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටින නන්දන ගුණතිලක මහතා එම පක්ෂයෙන් නෙරපීම අවශේව දේශපාලන සිද්ධීන් අතර වේ.

එක්සත් ජාතික පක්ෂ නායකත්වයේ බලතල අඩු කළයුතු බවට හා ලබන 19 දා පැවැත්වීමට නියමිත එම පක්ෂ ජාතික සම්මේලනය වනවිට එජාප ප්‍රතිසංවිධාන කටයුතු අවසන් කළයුතු බවට පක්ෂයේ ප්‍රබල පිරිසක් කටයුතු කරමින් සිටීමද අවශේෂ දේශපාලන කරුණු අතර තවත් කාරණයකි. පක්ෂ ප්‍රතිසංවිධානය සම්බන්ධයෙන් පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රමුඛ කණ්ඩායමක් සහ එජාප නියෝජ්‍ය නායක කරු ජයසූරිය මහතා ප්‍රමුඛ කණ්ඩායමක් වශයෙන් පක්ෂය තුළ පිල් දෙකක් බෙදී ඇති අතර පක්ෂ ප්‍රතිසංවිධානය පිළිබඳව එකඟතාවයක් ඇති නොවේ නම් පක්ෂය අර්බුදකාරී තත්ත්වයකට ගමන් කිරීම නොවැලැක්විය හැකි තත්ත්වයක් එජාපය තුළ දැන් උද්ගතව ඇත.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ පමණින් සියල්ල සිදුවී හමාර නැත. එම එකඟතාව ක්‍රියාත්මක කළහැකි යාන්ත්‍රණයක් සකසා ගැනීම දැන් පක්ෂ දෙක හමුවේ ඇති අනෙක් අභියෝගය වේ. මේ වනවිටත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ඒ පිළිබඳව සාකච්ඡා කර ඇත. ඒ සඳහා ප්‍රථමයෙන් එකඟතාවය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු සොයා බලා උපදෙස් දීම, සැලසුම් සැකසීම යනාදී කාරණා සඳහා එම නායකයින් දෙපළගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීමටද දෙපාර්ශවයේ එකඟතාවය පළවී ඇත. එම කමිටුව සඳහා මේවනවිට ආණ්ඩු පක්ෂයෙන් අගමැති රත්නසිරි වික්‍රමනායක, සභා නායක නිමල් සිරිපාල ද සිල්වා, ශ්‍රීලනිප මහ ලේකම් මෛත්‍රීපාල සිරිසේන, විපක්ෂයෙන් එජාප නියෝජ්‍ය නායක කරු ජයසූරිය, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝශප් මයිකල් පෙරේරා, මෙවර පක්ෂ සම්මේලනයෙන් තෝරා ගැනීමට යෝජිත එජාප සභාපති රුක්මන් සේනානායක යන මහත්වරු එම කමිටුවට පත්කර ගැනීමට පක්ෂ දෙකේ නායකයින් එකඟව ඇත.

එම එකඟතාව ක්‍රියාත්මක කිරීමේදී විධායක කාරක සභා ක්‍රමය යටතේ විපක්ෂයේ පක්ෂද ආණ්ඩුවේ වගකීම් භාර ගතයුතු බවට කරු ජයසූරිය, රත්නසිරි වික්‍රමනායක දෙපළගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුව එකඟතාවයකට පැමිණ සිටියද රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සමඟ එකඟතාවය ඇතිකර ගැනීමේදී එම කාරණය ඇතුළත් නොවීම සම්බන්ධයෙන් එජාපයේ වගකිව යුතු පිරිසක් කණස්සල්ලෙන් පසුවෙති. එම එකඟතාවය යථාර්තයක් කිරීමට නම් ආණ්ඩුවේ

***<u>එල්.ටී.ටී.ඊ. නායක වේළුපිල්ලේ ප්‍රභාකරන්ගේ උපන් දිනය වන නොවැ. 27 දාට යෙදී ඇති එල්.ටී.ටී.ඊ. මියගිය සාමාජිකයන් සමරණ මහවිරු දිනයට පෙර හෝ පසු ඒ වෙනුවෙන් රට තුළ කොතනක හෝ ප්‍රහාර එල්ල කර මහා විනාශ ඇති කරන සම්ප්‍රදායක් එල්.ටී.ටී.ඊ. ය පවත්වා ගෙන යයි.</u>***

වගකීම් පමණක් නොව ඇමැතිධූර පවා භාරගත යුතු යයි පවසන පිරිසක් එජාපයේ සිටිති. එම සියළු පිරිස්වල අදහස වී ඇත්තේ රනිල් වික්‍රමසිංහ මහතා එජාපයේ එම පිරිස අමාරුවේ දැමීමට රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපතිවරයා සමඟ එකඟතාවය ඇති කර ගැනීමේදී කෙටුම්පතෙන් එම කාරණය දැනුවත්වම හෙලා දමා ඇති බවකි. එය මේ වනවිට රනිල් වික්‍රමසිංහ මහතාට පාරා වළල්ලක්ව ඇති අතර පක්ෂ ප්‍රතිසංවිධානය වේගවත්ව අවසන් කළ යුතුයයි ඉල්ලා සිටින කරු ජයසූරිය, එස්.බී. දිසානායක පිලට ඔවුහු ගොනුව සිටිති.

අප මීට පෙර මෙම තීරු ලිපියෙන් කිහිපවිටකදීම අවධාරණය කර ඇති පරිදි එම තත්ත්වයන් හුදකලා සිදුවීම් නොව, පක්ෂ තුළ එවන් තත්ත්වයන් නිර්මාණය වීමට රට තුළ මෙන්ම සමාජය විසින් කරන බලපෑම තීරණාත්මක සාධකයක්ව ඇත. එය එක්සත් ජාතික පක්ෂයට පමණක් සීමා වූ කාරණයක් නොවී ජනතා විමුක්ති පෙරමුණ වැනි විනයක් සහිත වාමාංශික භාවිතාවක් ඇති දේශපාලන පක්ෂයකට පවා බලපෑමට හේතුවන්නේ එනිසාය. ජවිපෙන් නෙරපු නන්දන ගුණතිලක මීට මාස කිහිපයකට ඉහත දී සිය මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස් වූ එස්. අමරසිංහ යන මහත්වරු දෙපළද ජවිපෙ තුළ සමාන ස්ථාවරයන් හි සිටිමිනි ජවිපෙ ද මැදිහත්ව බලයට ගෙන ආ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව තුළ ඇමැතිධූර සහිතව වගකීම් භාර ගත යුතුය, යන ස්ථාවරයේ සිට කටයුතු කළ පුද්ගලයින්ය. ජවිපෙ තුළ පාර්ලිමේන්තුවේ සිට පළාත් පාලන ආයතන හරහා සාමාජිකත්වය දක්වාම එම ස්ථාවරය දරණ බොහෝ පිරිසක් සිටින බව එම පක්ෂ නායකයින්ට පවසති. ඒ අනුව පක්ෂ අභ්‍යන්තරයේ හට ගන්නා එම තත්ත්වයන් එක් පක්ෂයකට සීමා නොවන්නා සේම එය සමාජගත සෑම දේශපාලන පක්ෂයකටම බලපාන මහා පොදු සාධකයක් ලෙස පවතින බව එයින් මැනවින් තහවුරු වේ. එයට හේතුව රටේ පවත්නා සුවිශේෂ දේශපාලනික තත්ත්වය මෙන්ම යුද දේශපාලන සාධක බව පැහැදිලිය. අද එය සමාජයේ සෑම ක්ෂේත්‍රයකම පැවතිය යුතු සංවාදයකි. නොයෙක් දේශපාලන පක්ෂ තුළින් මතුවෙමින් තිබෙන්නේද එයයි. එය ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට මේ මොහොතේදී වාසි සහගත ලෙස බලපා තිබිය හැකිය. එය නොවැලැක්විය හැකි කාරණයක් ද වේ. එම තත්ත්වයන් ජනාධිපති රාජපක්ෂ මහතාගේ ලක් එක යයි කෙනෙකු ලඝු කොට සලකන්නේ නම් එයද වරද්දා ගැනීමකි. තත්ත්වය සුළුකොට තැකීමකි. එය මේ මොහොතේ නිර්මාණයව ඇති සමාජ තත්ත්වයන්ගේ ප්‍රතිඵල මිස කෙනෙකුගේ හෝ ව්‍යාපාරයක වාසියක් හෝ අවාසියක්ද නොවේ.

ජිනීවා සාකච්ඡාවලදී රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් රජය සිටි ස්ථාවරය නිවැරදිය. එහෙත් මුහමාලේ මුරපොළ විවෘත කරවා ගැනීමේ එල්.ටී.ටී.ඊ. උත්සාහය එම සංවිධානයට ලැබෙන බදු මුදල් අහිමිවීම නිසාම කරන ඉල්ලීමක් බවට තක්සේරු කිරීමද නිවැරදි නොවේ. එය අර්ධ සත්‍ය මිස සම්පූර්ණ සත්‍ය නොවේ. උතුරේ ජනතාව අතර එල්.ටී.ටී.ඊ. ය පිළිබඳ පවතින කණස්සල්ල මඟහැර ඔවුන් තවදුරටත් තහවුරු වීමද එහි තවත් එක් අරමුණකි. පවතින බාධක මඟහරවා ගනිමින් උතුරේ ජනතාවගේ මානුෂිය අවශ්‍යතා ඉටු කිරීමට රජය උපරිම අන්දමින් කටයුතු කළ යුතුව ඇත. ඊට සමාන්තරව ජාතික අර්බුදයට විසඳුමක් සඳහා රජය ඉදිරිපත් කරන යෝජනා සහිත සැකිල්ල හැකි ඉක්මණින් දෙස් විදෙස් ප්‍රජාව හමුවට ගෙන ඒමට රජය කටයුතු කළ යුතුව ඇත. එජාපය සමඟ ඇති කරගත් එකඟතාවය එය ඉක්මන් කිරීම සඳහා අවස්ථාවක් කරගත යුතුව ඇත. මෙම 16 දා ඉදිරිපත් කරන වත්මන් රජයේ දෙවන අයවැය යථාර්ථයක් කරගත හැක්කේද එමගිනි.

එල්.ටී.ටී.ඊ. නායක වේළුපිල්ලේ ප්‍රභාකරන්ගේ උපන් දිනය වන නොවැ. 27 දාට යෙදී ඇති එල්.ටී.ටී.ඊ. මියගිය සාමාජිකයන් සමරණ මහවිරු දිනයට පෙර හෝ පසු ඒ වෙනුවෙන් රට තුළ කොතනක හෝ ප්‍රහාර එල්ල කර මහා විනාශ ඇති කරන සම්ප්‍රදායක් එල්.ටී.ටී.ඊ. ය පවත්වා ගෙන යයි. ඔවුන්ගේ එම ක්‍රියාව පවතින සියළු තත්ත්වයන් වෙනස් කරන හා අප අනුමත නොකරන ස්වභාවයේ කටයුතු විය හැකිය. ඔවුන් ප්‍රචණ්ඩත්වය මුදා හරිනුයේ අප සූදානම් වෙමින් සිටින හෝ සූදානම් වන අවස්ථාවක නොව, ඔවුන්ට අවශ්‍ය වේලාවේදී මෙන්ම ඔවුන්ගේ සැලසුම ක්‍රියාවේ යෙදවීමට වඩාත් සුදුසුම අවස්ථාවේදීය. මේ මොහොතේ ඒ පිළිබඳව අවධානයකින් යුතුවද කටයුතු කළ යුතුව ඇත.


## කරුණාකර අපට සහය වන්න

අපි ප්‍රීතිමත් විවාහ ජීවිතයක් ගෙවන වෘත්තික පවුලක් වෙමු අපේ එකම බලාපොරොත්තුව වන දරුවකු ලබා ගැනීම සඳහා අපි වසර ගණනාවක් සිට වෛද්‍ය ප්‍රතිකාර ගනිමින් සිටින්නෙමු

අපේ සිහිනය මල් ඵල ගන්වා ගැනීම සඳහා දැන් අපට ඉතිරි වී ඇති එකම මාර්ගය තමාගේ බීජයක් දානය කිරීමට කැමති ශ්‍රී ලාංකික කාන්තාවකගේ සහයෝගය ලබාගැනීම පමණකි

ඔබ වයස අවුරුදු 35 ට අඩු කාන්තාවක නම් සහ දැනටමත් ඔබේ පවුල සැළසුම් කර අවසන් නම් අපට උපකාර කිරීමට ඔබට හැකියාවක් ඇත

කරුණාකර "Helping our Women" Sannasa, No.22, Lorne Sr. Lalor, Vic 3075 ලිපිනයට ලිපියක් එවා හෝ

help1woman@yahoo.com.au ඊමේලයක් එවා හෝ

0432 077 038 දුරකථනයට හෝ අප අමතන්න

මේ සඳහා ඔබට දරන්නට වන සියලුම වියදම් ගෙවන්නට අපි කැමැත්තෙමු

කරුණාකර අපට සහය වන්න

This advertisement has been approved by the Victorian Minister of Health, as required by s.40 of the Human Tissue Act 1982 (Vic) (October 2006)